**ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල - 2022**

**----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණු අවධාරණය කිරීම

අරමුදලට අඛණ්ඩ පැවැත්මක් නොමැති බව කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විගණනයට දන්වා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් ද ඒ පිළිබඳව හෙළිදරව් කර තිබුණි.
තවද, මෙම අරමුදල අහෝසි කිරීම සඳහා කඩිනමින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කිරීමට යෝජිත බවත්, ඒ තුළින් අරමුදල පිහිටුවීම, එහි ගනුදෙනු හා වගකීම් පියවීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය විසින් භාර ගැනීම, ඇවර කිරීම යනාදිය සම්බන්ධව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නියමිත බවත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2021 නොවැම්බර් 25 දින විගණනයට දැනුම් දී තිබුණ ද, 2023 මාර්තු 24 දින වන විටත් එසේ සිදු කර නොතිබුණි.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ

පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මිල ස්ථායීකරණ අරමුදලක් ඇතිකිරීමේ අපේක්ෂිත අරමුණ වනුයේ ලෝක වෙළඳපොලේ මිල වැඩිවීමේදී හා අඩුවීමේදී සිදුවන දේශීය මිල උච්චාවචනයන් පාලනය කර ස්ථාවර මිලක් පවත්වා ගැනීම වේ. ලෝක වෙළඳපොලේ ඉන්ධන මිල අඩු වී තිබියදීත් ආනයනයේදී අධිභාරයන් අයකර පැවති මිලටම ඉන්ධන අලෙවි කිරීම හේතුවෙන් 2020 මාර්තු සිට 2021 ජනවාරි මාසය දක්වා කාලය තුළ ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල රු.22,434,531,371 ක සමුච්චිත ශුද්ධ අතිරික්තයක් උපයාගෙන තිබුණි. මෙම අතිරික්තය ලෝක වෙළඳපොලේ ඉන්ධන මිල වැඩිවීමකදී දේශීය මිල ස්ථායිව පවත්වා ගෙන යාම සඳහා ද්‍රවශීල වත්කමක් ලෙස පවත්වාගෙන යා හැකිව තිබුණද, අමාත්‍ය මණ්ඩල තීරණයේ ඒ බව සඳහන් කර නොතිබුණු අතර එහි ලබා තිබුණු අනුමැතිය පරිදි භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලද මුදල් ද භාවිතා කර අරමුදලේ රු.බිලියන 48 ක මුදල් විදුලිබල මණ්ඩලය වෙත ප්‍රාග්ධන දායකත්වයක් ලෙස 2020 වර්ෂයේදී ලබාදී තිබුණි. | මෙම අරමුදල ආරම්භ කිරීම සඳහා අත්තිකාරමක් ලෙස මුදල් අමාත්‍යවරයාගේ අංක MFE/ERD/17/CM/2020/072 හා 2022.03.31 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් පොත් අගය රු.බිලියන 47.47ක් වූ (මුහුණත අගය රු.බිලියන 50ක් වූ) මුදලක් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර ලබා ගෙන එම මුදල් සහ අධිභාර මුදලින් කොටසක් සමඟ රු.බිලියන 48ක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දෙනු ලැබූ අතර එම රු. බිලියන 48ක මුදල පමණක් නිවැරදිව අරමුදල මගින් සැපයූ ප්‍රාග්ධන දායකත්වය ලෙස ගිණුම් වල දක්වා ඇත. එමෙන්ම, මෙම රු. බිලියන 48 වැය කර ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලංකා ඛණිජ තෙල් සංස්ථාවට ඇති වගකීම් නිදහස් කලයුතු වීම උක්ත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ කොන්දේසියකි. එමගින් ඛණිජ තෙල් සංස්ථාවේ මූල්‍ය තත්ත්වය යහපත් කර ඉන්ධන මිල ඉහළ යාම පාලනය කිරීම ප්‍රධාන අරමුණ විය. ඒ අනුව, 2020 වර්ෂය තුළ හා 2021 ජනවාරි මුල් කාල සීමාව තුළ අඛණ්ඩව ලෝක වෙළඳපළේ ඉන්ධන මිල ඉහළ යාම හමුවේ පසුගිය ඉන්ධන මිල සංශෝධනය දක්වා මිල ස්ථාවරව පවත්වා ගත හැකි විය. | ලෝක වෙළඳපළේ ඉන්ධන මිල වෙනස් වීමට සාපේක්ෂව දේශීය ඉන්ධන මිල ස්ථායීකරණය සඳහා අරමුදල උපයෝජනය කළ යුතු වීම. |

තවද, මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියෙන් හා ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල් කමිටුවේ එකඟත්වයෙන් ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලේ ආයෝජන ලෙස දක්වා තිබුණු රු.බිලියන 48 ක් වූ විදුලිබල මණ්ඩලයේ ප්‍රාග්ධන දායකත්ව වත්කමෙන් රු.22,434,281,242 ක් ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලේ සමුච්චිත අරමුදලට එරෙහිව හිලව් කර ගිණුම්වල ගැලපීමට කටයුතු කර තිබුණි. විදුලිබල මණ්ඩලයේ ප්‍රාග්ධන දායකත්ව වත්කමේ ඉතිරි රු.25,565,718,758 ක වටිනාකමින් රු.24,543,438,158 ක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව පැවති රු.25,565,718,758 ක් වූ වගකීම් ගිණුමට හිලව් කර ඉතිරි රු.1,022,280,600 ක මුදල ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලේ විදුලිබල මණ්ඩලයේ ප්‍රාග්ධන දායකත්ව වත්කම ලෙස හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බැරකමක් ලෙස 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්වා තිබුණි. කෙසේ වෙතත්, රු.48,000,000,000 ක් වූ එම ප්‍රාග්ධන දායකත්වය තවදුරටත් මුළුමනින්ම ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලේ ප්‍රාග්ධන දායකත්වයක් ලෙස විදුලිබල මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 2.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව විසර්ජන පනතින් අනුමත කෙරෙන අයවැය ඇස්තමේන්තුවට පරිබාහිරව ආදායම් රැස් කිරීම හා වියදම් දැරීම අනුමත නොවුවත් 2020 මාර්තු මස 18 දින සිට මෙම අරමුදල ආරම්භ | 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මු. රෙ. 876 ප්‍රකාරව, චක්‍රලේඛය නිකුත් කරන අවස්ථාවේදී ක්‍රියාත්මක වූ ව්‍යවස්ථාපිත හෝ ව්‍යවස්ථාපිත නොවන භාර අරමුදල් තවදුරටත් පවත්වාගෙන යාම අවශ්‍ය නොවේ යැයි පෙනී යන්නේනම් හෝ එම අරමුදල මගින් අපේක්ෂිත අරමුණු රජයේ | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | |
|---|---|
| කර තිබූ අතර 2020 අගෝස්තු 28 දිනැති හා අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මු.රෙ. 876 ප්‍රකාරව ලබාගත යුතු පාර්ලිමේන්තු අනුමැතිය විගණිත දිනය වූ 2023 මාර්තු 24 දින වන විටත් ලබාගෙන නොතිබුණි. | විසර්ජන පනතින් අනුමත කරන රාජ්‍ය අයවැය යටතේ ඉටුකරගත හැකි බව පෙනී යන්නේ නම්, එකී අරමුදල් අහෝසි කිරීමට පියවර ගත යුතු අතර, ඒ සඳහා පාර්ලිමේන්තු අනුමැතියක් ලබා ගැනීම අවශ්‍ය නොවේ. |

**2.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ජනවාරි මස 18 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණයකට අනුව ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල ශක්තිමත් කිරීම සඳහා රුපියල් බිලියන 48 ක අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කිරීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලෙස භාණ්ඩාගාරයේ ලේකම් වෙත නියෝග කර තිබුණද එම නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. | වර්තමානය වන විට රට තුළ පැනනැගී ඇති ආර්ථික අර්බුදය හමුවේ ප්‍රමුඛතා කාර්යයන් මත මෙන්ම භාණ්ඩාගාරයේ පවතින අරමුදල් තත්ත්වයද සැලකිල්ලට ගෙන අරමුදල් නිදහස් කිරීමට කටයුතු කරන බැවින් මෙතෙක් අදාල රු.බිලියන 48 ක මුදල නිදහස් කිරීම සිදු කර නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අරමුදල ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු වීම. |
| (ආ) | 2020 අප්‍රේල් 02 දිනැති අංක 20/0684/204/060 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා ඊට අදාළ සමාංක හා 2020 මාර්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ 02 ඡේදය ප්‍රකාරව, මෙම අරමුදල කළමනාකරණය සඳහා කමිටුවක් පත් කළ යුතු වුවද, එම කළමනාකරණ කමිටුවේ නිලධාරීන් වෙත නිකුත් කළ පත්වීම් ලිපි හා ඊට ලබාදුන් නියෝග පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාල නිලධාරීන්ට විධිමත් පරිදි පත්වීම් ලිපි නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | පත්වීම්, විධිමත් ලිපියක් මගින් සිදු කළ යුතු වීම හා විධිමත්ව නියෝග නිකුත් කිරීම සිදු කළ යුතු වීම. |

**2.4 අරමුදල ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 මාර්තු 11 වන දින වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් භාණ්ඩාගාර ලේකම් මගින් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ සටහනට අනුව, 2020 මාර්තු 09 දින වනවිට අන්තර්ජාතික වෙළඳපොලේ බොරතෙල් මිල සියයට 42.5 කින් පහළ බැස ඇති බවත්, ඒ වනවිට බොරතෙල් බැරලයක වටිනාකම එ.ජ. ඩොලර් 34.63 ක් පමණ වන බවත්, 2019 සැප්තැම්බර් මස වනවිට එය එ.ජ. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | තොරතුරු ඉදිරිපත් කිරීමකි. |

ඩොලර් 59.73 ක් වන බවත් දන්වා තිබුණි. මේ සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් කළ ගණනය කිරීම් අනුව, බොරතෙල් මිල පහළ යාම හේතුවෙන් ඉන්ධන ලීටරයක මිල පහත පරිදි පහළයාමක් බලාපොරොත්තු වී තිබුණි.

| | **පෙට්‍රල් 92 ඔක්ටේන්** | **පෙට්‍රල් 95 ඔක්ටේන්** | **ඔටෝ ඩීසල්** | **සුපිරි ඩීසල්** |
|---|---|---|---|---|
| මිල ගැලපුම (ලීටරයකට) (ආසන්න වශයෙන්) (රු.) | 12 | 15 | 14 | 20 |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෙම මිල පහළයාමේ වාසිය, ලබාදී ඇති බදු සහන අයකර ගැනීමෙන් පසු මුළු ප්‍රතිපාදනයම මහජනතාවට ලබාදීම, බදු අයකිරීම ඉහළ නංවා මුළු ප්‍රතිලාභයම රජයේ ආදායමට ලබාගැනීම, ඉන්ධනවල සිල්ලර මිල පහත දැමීම හා ඉන්ධන මිලෙහි වෙනසක් නොකොට ඉන්ධන සැපයුම් ආයතන විසින් අවසාන මාස 05 තුළදී ලබා ඇති පාඩුව පූර්ණය කරගැනීම ලෙස විකල්ප 04 ක් යටතේ ඇගයීම් කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | තොරතුරු ඉදිරිපත් කිරීමකි. |
| (ඇ) | කෙසේ වෙතත්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සටහනේ (ආ) ඡේදය අනුව ඔටෝ ඩීසල් සඳහා රු.11 ක් ද, පෙට්‍රල් 95 ඔක්ටේන් සඳහා රු.15 ක් ද, සුපිරි ඩීසල් සඳහා රු. 20 ක්ද වශයෙන් වූ මිල අඩුවීමේ ඉතිරිය සඳහා රේගු ආඥා පනත යටතේ අධිභාරයන් පැනවීම හෝ වෙළඳපොළ මිල අඩුකිරීම සඳහා මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයාගේ අනුමැතිය අපේක්ෂා කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | තොරතුරු ඉදිරිපත් කිරීමකි. |
| (ඈ) | ඒ අනුව, 2020 මාර්තු 13 දිනැති අංක 2166/35 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනය මඟින් පහත පරිදි ඉන්ධන හා සම්බන්ධ තීරු බද්ද සමඟ අයකළ යුතු අධිභාරය 2020 මාර්තු 14 දින සිට මාස 02 ක කාල සීමාවක් සඳහා බලපැවැත්වෙන පරිදි නියම කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | තොරතුරු ඉදිරිපත් කිරීමකි. |

| | **පෙට්‍රල් 92 ඔක්ටේන්** | **පෙට්‍රල් 95 ඔක්ටේන්** | **ඔටෝ ඩීසල්** | **සුපිරි ඩීසල්** |
|---|---|---|---|---|
| අධිභාරය (ලීටරයකට) (රු.) | 0 | 15 | 11 | 20 |

(ඉ) පසුව අන්තර්ජාතික වෙළඳපලේ බොරතෙල් මිල උච්චාවචනය වූ අවස්ථාවලදී පහත පරිදි අධිභාර වටිනාකම අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනය මඟින් සංශෝධනය කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | තොරතුරු ඉදිරිපත් කිරීමකි.

| ගැසට් පත්‍ර අංකය | දිනය | බලපැවැත්වෙන කාලය | පෙට්‍රල් 92 ඔක්ටේන් රු. | පෙට්‍රල් 95 ඔක්ටේන් රු. | ඔටෝ ඩීසල් රු. | සුපර් ඩීසල් රු. |
|---|---|---|---|---|---|---|
| 2172/6 | 2020.04.22 | මාස 02 | 26 | 49 | 24 | 40 |
| 2181/13 | 2020.06.24 | මාස 02 | 0 | 20 | 12 | 30 |
| 2189/57 | 2020.08.23 | මාස 03 | 0 | 20 | 12 | 30 |
| 2203/1 | 2020.11.23 | මාස 03 | 0 | 20 | 12 | 30 |
| 2213/7 | 2021.02.01 | 2021.02.02 සිට 2021.02.23 දක්වා | 0 | 0 | 0 | 0 |

(ඊ) 2021 පෙබරවාරි 01 දිනැති අංක 2213/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කල නිවේදනය මඟින් 2020 නොවැම්බර් 23 දිනැති අංක 2203/1 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනය මඟින් ප්‍රකාශිත නියමය 2021 පෙබරවාරි 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | තොරතුරු ඉදිරිපත් කිරීමකි.